**මීනුවන්ගොඩ ප්‍රාදේශීය සභාව**

**---------------------------------**

**ගම්පහ දිස්ත්‍රික්කය**

**--------------------**

1. මූල්‍ය ප්‍රකාශන.

---------------

මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

---------------------------------

1.1 2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 සැප්තැම්බර් 27 දින ලේකම්වරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය

----------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට මීනුවන්ගොඩ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

--------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

-----------------------

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) 2015 වර්ෂයේ ගිණුම් ගත නොකල ස්ථාවර තැන්පත් පොලිය සමාලෝචිත වර්ෂයේදී ගිණුම් ගත කිරීමේදි සමුච්චිත අරමුදලට බැර කිරීම වෙනුවට ස්ථාවර තැන්පත් පොලී ගිණුම බැර කිරීම නිසා සමාලෝචිත වර්ෂයේ ආදායම රු.760,278 කින් වැඩිවී තිබුණි.

(ආ) 2017 අගෝස්තු 17 දින තැන්පත් කරන ලද රු.30,000,0000 ක ස්ථාවර තැන්පතුව සඳහා සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ලැබිය යුතු පොලී ආදායම රු.1,237,500 ගිණුම්වලට ගැලපීම් කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය සඳහා බලපත්‍ර ගාස්තු බිල් කිරීම රු.1,785,969 ක් වුවද රු. 1,616,732 ක් ලෙස ගිණුම්ගත කර තිබීම නිසා එම ආදායම රු. 169,237 ක් අඩුවෙන් ගිණුම් ගත කර තිබුණි.

(ඈ) වර්ෂය තුල වරිපනම් අයකිරීමේදී ලබාදී තිබූ වට්ටම් මුදල රු.1,216,681 ක් වුවද රු.1,37 4,112 ක් ලෙස ගිණුම් ගත කර තිබීම නිසා දුන් වට්ටම් රු.157,431 ක් වැඩියෙන් ගිණුම් ගත කර තිබුණි.

1.3.2 නොසැසඳුණු ගිණුම්

------------------------

(අ) 2017 දෙසැම්බර් 31 දිනට ගිණුම් විෂයයන් 09 ක ගිණුම් අනුව ශේෂයන් හා එදිනට උපයෝගී ලේඛන අනුව ශේෂයන් අතර රු. 8,722,455 ක වෙනසක් විය.

(ආ) 2017 දෙසැම්බර් 31 දිනට ආදායම් වෙනුවෙන් තැන්පතු ශේෂය , ගිණුම අනුව 30,263,684 ක්ද ලෙජරය අනුව රු. 16,929,558 ක්ද හා උපයෝගී ලේඛන අනුව රු.12,523,243 ක්ද වශයෙන් ශේෂ වෙනස්කම් විය.

1.3.3 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

-------------------------------------------------------

තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම

-----------------------------------------------

ශේෂ තහවුරු කිරීම් හා සනාථ කිරීම් ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.1,144,079 ක් ගිණුම් විෂයයන් 02 ක් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

1.3.4 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

---------------------------------------------------------------------------

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති,රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව. | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|---|
| | | රු. | |
| (අ) | 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ (iv) අ කොටසේ 17 (ආ) වගන්තිය | - | මාරපොල අන්නාසි වත්ත ඉඩමේ අනුබෙදුම 2004 වර්ෂයේ අනුමත වී ඇතත්, අවසන් ඉඩම් කට්ටිය අලෙවි වී තිබුණේ 2017 ඔක්තෝබර් 13 දිනදී වන බැවින් අනු බෙදුම් වලංගු කාලය දීර්ඝ කර නොතිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 395 | - | බැංකු ජංගම ගිණුම් 02 ක් සඳහා වෙන වෙනම බැංකු සැසඳුම් පිළියෙල කර නොතිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය

---------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල

----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.21,288,135 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.3,234,067 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

-------------------------

2.2.1 ඇස්තමේන්තුගත ආදායම් , බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

------------------------------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්,බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ

| | | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | '000 රු. | '000 රු. | '000 රු. | '000 රු. | '000 රු. | '000 රු. | '000 රු. | '000 රු. |
| (i) | වරිපනම් හා බදු | 22,161 | 19,805 | 19,734 | 8,734 | 20,223 | 18,964 | 20,553 | 8,990 |
| (ii) | කුලී | 2,581 | 1,984 | 1,817 | 171 | 1,770 | 2,457 | 2,552 | 04 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,601 | 1,617 | 1,744 | (127) | 2,610 | 1,922 | 1,922 | - |
| (iv) | වෙනත් ආදායම් | 9,509 | 534 | 480 | 104 | 8,125 | 388 | 528 | 49 |

2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්ය සාධනය

-----------------------------------------

(අ) වර්ෂය ආරම්භයට තිබූ වරිපනම් හිඟ මුදලෙන් රු. 4,101,124 ක් පමණක් වර්ෂය තුළ අය කර තිබුණි.

(ආ) ඉකුත් වර්ෂය අවසානයට තිබූ රු.4,300 ක කුලී හිගය සමාලෝචිත වර්ෂය අවසානයට රු. 171,292 දක්වා වැඩිවී තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානයට සත්‍ය බලපත්‍ර ගාස්තු හිඟය රු.42,000 ක් වුවද ගිණුම්වල රු.127,000 ක සෘණ ශේෂයක් ලෙස දක්වා තිබුණි.

2.2.3 වරිපනම් හා බදු

----------------

(අ) මාබොදල හා උඩුගම්පොල උප කාර්යාවල දේපල තක්සේරුව අවසන්වරට සිදුකර තිබුණේ 2009 වර්ෂයේදීය.

(ආ) 2017 දෙසැම්බර් 31 දිනට වූ පෙර වර්ෂවලට අදාල හිඟය වූ රු.6,893,689 ක් තුළ උඩුගම්පොල උප කාර්යාලයේ වරිපනම් ඒකක 1964 කින් රු.1,795,332 ක් හා මිනුවන්ගොඩ උප කාර්යාලයේ වරිපනම් ඒකක 2736 කින් රු. 2,334,001 ක් අය විය යුතු විය.

2.2.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු

------------------------------

(අ) 2008 වසරේ සිට 2013 වර්ෂය දක්වා ප්‍රාදේශිය සභාවට අයවිය යුතු රු.1,880,478 ක උසාවි දඩ මුදල් පළාත් ආදායම් කොමසාරිස් විසින් අත්තනගල්ල ප්‍රාදේශිය සභාවට යවා තිබූ අතර 2017 අගෝස්තු 17 දින පැවති රාජ්‍ය ගිණුම් කාරක සභාවේදී අත්තනගල්ල ප්‍රාදේශිය සභාවෙන් එම මුදල් ආපසු ගෙන්වා ගැනීමට කටයුතු කරන ලෙස නියෝග කර ඇතත් මේ දක්වා එම මුදල් ගෙන්වා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2014 සිට 2017 දක්වා මීනුවන්ගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අදාලව පවරන ලද නඩු සම්බන්ධයෙන් අයවිය යුතු උසාවි දඩ මුදල් අයකරගෙන නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය
-----------------------------

3.1 කාර්ය සාධනය
-----------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම,ජනතාවගේ සුබ විහරණය පහසුව හා සුභ සාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) කර්තව්‍යයන් ඉටු කිරීමේ ප්‍රමාදයන්
------------------------------------

පෙරටු කාර්යාල ස්ථාපිත කිරීමේ වැඩසටහන යටතේ රු. 199,777 කට ඇස්තමේන්තුවක් සකස් කර 2017 නොවැම්බර් 02 වන විට එයට කාර්යාල උපකරණ මිලදී ගැනීම් කර තිබූ නමුත් 2018 මැයි 15 වන විටත් එම පෙරටු කාර්යාලය ඉදි කිරීම සිදුකර නොතිබුණි.

(ආ) අපේක්ෂිත ප්‍රතිලාභ (outcome) ලබා නොගැනීම
--------------------------------------------------

(i) කොම්පෝස්ට් අංගනයේ නිෂ්පාදනය කරනු ලබන කොම්පෝස්ට් හා බේල් කරන ලද පොලිතීන් ගබඩා කිරීමේ අරමුණින් රු. 2,423,794 ක් වැය කර ගබඩා කාමර 03 කින් යුත් සම්පත් කේන්ද්‍රයක් ඉදිකර තිබුණද එම සම්පත් කේන්ද්‍රය 2018 මාර්තු 14 දින වන විටත් පරිහරණය සඳහා යොදා ගෙන නොතිබුණි.

(ii) සියනෑ ස්වශක්ති වැඩසටහන මගින් කාබනික එලවලු පලතුරු හා දේශීය අමුද්‍රව්‍ය ආශ්‍රිතව සකස් කරන ආහාර අලෙවි කරන, හෙල බොජුන් හලක් රු.545,500 ක් වැය කර උඩුගම්පොල මින්මැදුර අසල ඉදි කර 2017 ඔක්තෝබර් මස වන විට බොජුන්හල ආරම්භ කිරීමට සැලසුම්කර තිබුණද 2018 අප්‍රේල් වන විටත් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක මට්ටමේ නොපැවතුණි.

(ඇ) ඝන අපද්‍රව්‍ය කළමණාකරනය
-------------------------------

(i) ප්‍රදේශයේ එක්රැස් වන දිරාපත් වන කසළ භාවිතා කර කොම්පෝස්ට් නිෂ්පාදනය කිරීමේ අරමුණින් මාබොදල ගෝන මඩේවත්ත ප්‍රදේශයේ විශාල ඉඩකඩ සහිත කොම්පෝස්ට් අංගනයක් ඉදි කර තිබූ නමුත් 2018 මාර්තු 14 දින වන විටත් කොම්පෝස්ට් අංගනය තුල කොම්පෝස්ට් නිෂ්පාදන කිරීමේ කටයුතු ක්‍රියාත්මක කර නොතිබුණි.

(ii) කොම්පෝස්ට් අංගනය පවත්වාගෙන යාම අපද්‍රව්‍ය වෙන්කිරීම හා ප්‍රතිචක්‍රීකරණ කටයුතු වල ප්‍රගතිය සියයට 99 ක් ලෙසද සම්පත් කේන්ද්‍රය පවත්වාගෙන යාමේ ප්‍රගතිය සියයට 98 ක් ලෙසද වාර්තා කර තිබුණද කොම්පෝස්ට් අංගණයේ කොම්පෝස්ට් නිශ්පාදනය කිරීමේ කටයුතු සිදුනොවන බව හා සම්පත් කේන්ද්‍රයේ කටයුතු නිමකර තිබුණද එය පරිහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) තිරසර සංවර්ධන ඉලක්ක

-----------------------------

එක්සත් ජාතීන්ගේ සංවිධානයේ තිරසාර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රය පිළිබඳව සභාව විසින් දැනුවත්වීමක් සිදුව තිබුණද අදාල ඉලක්ක කරා ලඟා වීමේදී අදාල කාර්යයන් නියාමනය කිරීමට අවශ්‍ය සංධිස්ථාන හඳුනාගෙන නොතිබුණි.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

------------------------------------

(අ) සමාලෝචිත වර්ෂයේ බැංකු ජංගම ගිණුම් දෙකෙහි සාමාන්‍ය ශේෂය රු.67,956,145 ක්වූ අතර එය අත රඳවා තබා ගැනීම තුල ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් ක්‍රියාත්මක කල යුතු සංවර්ධන වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම අවම මට්ටමක පැවතුණි.

(ආ) සභාව සතු උඩුගම්පොළ මීන් මැදුර රථ ගාලේ නවතා තබන වාහන සඳහා ප්‍රවේශ පත්‍ර නිකුත් කර මුදල් රැස් කිරීම සඳහා වගකිව යුතු පුද්ගලයෙකු පත් නොකර එම කටයුතු මීන් මැදුර හා පරිශ්‍රය පිරිසිදු කිරීමේ වැඩ සිදු කරන ක්ෂේත්‍ර කම්කරුවකු වෙත පවරා තිබුණි.ඔහු උදේ කාලයේ මීන් මැදුර හා පරිශ්‍රය පිරිසිදු කිරීමේ කටයුතුවල නිරතවන බැවින් එකී කාලය තුළ නවතා තබන වාහන සඳහා

ප්‍රවේශ පත්‍ර නිකුත් කර නොතිබූ අතර ඒ හේතුවෙන් සභාවට ලැබිය යුතු ආදායම් නිසි පරිදි ලැබී නොතිබුණි.

3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

--------------------------

ඉඩම් අනුබෙදුම් කර විකිණීම සඳහා සභාව විසින් අනුමැතිය ලබාදීමේදී අභ්‍යන්තර මාර්ග සංවර්ධනය කළයුතු බවට කොන්දේසි ඉදිරිපත් නොකිරීම නිසා එම සභාවට පවරා ගන්නා ලද වෙන්දේසි ඉඩම්වල මාර්ග සංවර්ධනය කිරීම සඳහා සභාව විසින් විශාල වියදමක් දරා තිබුණි. එසේ පවරා ගන්නා ලද වෙන්දේසි ඉඩම් 07 ක පාරවල් කොන්ක්‍රීට් කිරිම වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළ රු. 3,954,490 ක වියදමක් සභාව විසින් දරා තිබුණි.

3.4 වත්කම් කළමණාකරණය

----------------------------

3.4.1 පවරා නොගත් වත්කම්

-------------------------

වෙන්දේසි ඉඩම් 04 ක මාර්ග සභාවට පවරා ගැනීමට පෙර රු.985,280 ක වියදමක් දරා සභාව විසින් කොන්ක්‍රිට් කර තිබුණි.

3.4.2 වත්කම්වල ආරක්ෂාව තහවුරු නොකිරීම

----------------------------------------------

(ඇ) වෙන්දේසි ඉඩම්වලින් සභාව වෙත ලබාදී තිබූ නිල්පනාගොඩ පිහිටි පොදු ඉඩමක අනවසර පදිංචිවීමක් සිදුව ඇති බව අනාවරණය වූ අතර 1987 ප්‍රාදේශීය සභා පණතේ විධිවිධාන ප්‍රකාරව එම පුද්ගලයන් ඉවත් කිරීමට 2018 මාර්තු 14 දින වන විටත් කටයුතු කර නොතිබුණි. මෙම පොදු ඉඩම්වල ඔප්පු විගණනයට ඉදිරිපත් නොකෙරුණි

3.5 ප්‍රසම්පාදනය

-------------

3.5.1 කොන්ත්‍රාත් පරිපාලනය

--------------------------

(අ) වැගොව්ව නාගහ අසලින් වේයන්ගොඩ පාර දක්වා මාර්ගයේ ( සුමිත්‍ර මාවත ) හරස් මාර්ගය (1අදියර) කුට්ටි ගල් ඇතිරීම රු.998,468 ක වටිනාකමකට 2014 නොවැම්බර් 13 දින වැගොව්ව ගොවි සංවිධානයට මාස 03 කින් නිම කිරීමට පවරා තිබූ අතර ගල් පිළිබඳ ප්‍රමිති සහතිකය 2015 නොවැම්බර් 15 දින ලැබී තිබුණි. ගිවිසුමේ කාලය ඉක්ම ගොස් තිබුණද කාලය දීර්ඝ කරගැනීමක් සිදුව නොතිබූ අතර කර්මාන්තය සම්බන්ධයෙන් කිසිදු අධීක්ෂණයක් කල බවටද සාක්ෂි නොතිබුණි. 2017 පෙබරවාරි 17 දින එම ගොවි සංවිධානය විසින් රු.996,416 ක් ගෙවීම් කරන ලෙස ඉල්ලීම් කර තිබුණි.

(ආ) උඩුගම්පොල සතිපොළ ඉදිකිරීම සඳහා 1 වන අදියරේ කොන්ත්‍රාත් කාලය 2015 ජූලි 15 දින දක්වා හා 2 වන අදියරේ කොන්ත්‍රාත් කාලය 2016 ජූලි 15 දින දක්වා දීර්ඝ කර තිබුණද, කාර්ය සාධන ඇපකරයේ දින දීර්ඝ කර නොතිබුණි. 1 වන අදියර මාස 04 ක් හා 2 වන අදියර මාස 03 ක් ප්‍රමාදවී තිබූ බැවින් ගිවිසුමේ 4 වන වගන්තිය අනුව අදියරයන් දෙක සඳහා එක් සතියකට පිළිවෙලින් රු.155,247 ක් හා රු.63,594 ක් බැගින් රු.3,247,080 ක ප්‍රමාද ගාස්තු අය කර නොතිබුණි.

(ඇ) පළාත් පාලන ආයතන නගා සිටුවීමේ ප්‍රාග්ධන වැඩසටහන යටතේ පත්තඩුවන උපකාර්යාලය හා පුස්තකාල ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා 2016 ජූලි 18 දින, රු.4,620,000 කට පලමු අදියර හා දෙවන අදියර රු.5,000,000 කට(වැට් සහිතව) ඇස්තමේන්තු කර තිබූ අතර මේ පිළිබඳව පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(i) වැඩ විෂයය අංක 1 සිට 24 දක්වා පලමු අදියරයද, වැඩ විෂයය අංක 25 සිට 42 දක්වා දෙවන අදියරයද ලෙස දක්වා තිබූ අතර ප්‍රමාණපත්‍ර සකස්කර තිබුණේ පළමු අදියර සඳහා පමණක් විය. පළමු අදියරේ හා දෙවන අදියරේ වටිනාකම් සඳහා වෙන වෙනම ගිවිසුම් ගත වී තිබුණද පුවත් පත් දැන්වීම් සකස්කර තිබුණේ එක් ඇස්තමේන්තුවක් ලෙසින් වන අතර ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.9.1(ආ) අනුව ලංසු ඇගයීම ලංසු කැඳවීමේ ලේඛනවල සඳහන් කර ඇති ක්‍රමයට අනුකූල විය යුතු බව දන්වා තිබුණද ඊට පටහැනිව ඇස්තමේන්තු දෙක එකක් සේ සලකා ඇගයීම් කමිටුව විසින් තීරණ ගෙන ගිවිසුම්ගතව තිබුණි.

(ii) ඇස්තමේන්තුවේ පළමු අදියරේ වටිනාකම රු.4,013,550 (වැට් රහිත) ක් වූ අතර ටෙන්ඩරය පිරිනමන ලද අවම ටෙන්ඩර්කරුගේ වටිනාකම රු.5,181,995 වී තිබුණි. තාක්ෂණ ඇගයීම් කමිටුව විසින් ඇස්තමේන්තු දෙකම එකක් ලෙස සලකා අවම ටෙන්ඩර්කරුට ටෙන්ඩරය පිරිනමා තිබුණේ මුලු ටෙන්ඩරය සියයට 0.51 ක් අඩු බව සඳහන් කරමිණි. පළමු අදියරේ අවම ටෙන්ඩර්කරුගේ ලංසුව ඇස්තමේන්තුව ඉක්මවා රු.1,168,445 ක් වී තිබූ අතර ඇස්තමේන්තු මුදලට ලංසුව බාර දීමට කැමති කරවා නොගෙන අවම ලංසුව බව පවසා එම කොන්ත්‍රාත්කරුට ටෙන්ඩරය පිරිනැමීම නිසා සභාවට රු.1,168,445 ක පාඩුවක් වී තිබුණි. මෙහි ඇස්තමේන්තු වටිනාකම හා ගිවිසුම් වටිනාකම අතර විශාල මිල විචලනයන් සිදුව තිබූ අතර ඇගයීම් කමිටුව විසින් හා ටෙන්ඩර් මණ්ඩලය විසින් ඒ පිළිබඳව නොසලකා හැර තිබුණි.පළමු අදියරේ ඇස්තමේන්තුවේ අවසන් වැඩ විෂයය අංක 21,23 හා 24 යන කාර්යයන් නිම කර

නොතිබූ අතර වැඩ අවසන් කල බවට නිර්දේශයන් නොමැතිව 2017 මාර්තු 09 දින රු.4,002,155 ක් ව ගෙවා තිබුණි.

(iii) දෙවන අදියරේ ඇස්තමේන්තුව රු.4,294,116 ක් වී තිබූ අතර කොන්ත්‍රාත්තුව ප්‍රදානය කළ කොන්ත්‍රාත්කරුගේ ලංසුව රු.3,083,540 ක් විය. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7:9:11 පරිදි අතාත්වික හා අඩු අනු ප්‍රමාණ රේට් සඳහා ඇගයීම් කමිටුව කරුණු විමසීමක් කළ යුතු වුවද එසේ කළ බවට සාක්ෂි ගොනුවේ නොතිබූ අතර එය රු.1,210,576 ක හෙවත් සියයට 28.1 ක අඩුවීමක් විය.

(iv) දෙවන අදියර 2017 පෙබරවාරි 27 දින අවසන් කර තිබූ අතර පළමු අදියර හා දෙවන අදියර එක් ගෙවීමක් ලෙස සලකා ගෙවීම් ඉදිරිපත් කර තිබුණි. ඒ අනුව පලමුවන අදියරේ 21,23,24 වැඩ විෂයයන් සමඟ සම්පූර්ණ වශයෙන් නිම කිරීම කර තිබුණේ දෙවන අදියරේදී වන අතර ඒ සඳහා ප්‍රමාද ගාස්තු ගණනය කර අයකර නොතිබුණි.

(ඉ) පත්තඩුවන උපකාර්යාලය හා පුස්තකාල ගොඩනැගිල්ල ඉදිකිරීමේ අවසන් අදියරට (III අදියර) අවම ලංසුව ඉදිරිපත් කර තිබූ ඉහත කොන්ත්‍රාත්කරු සමග 2017 ජූලි 12 දින මාස තුනකින් නිමකිරීමට රු.7,934,169 කට ගිවිසුම් ගත වී තිබුණි.2017 ඔක්තෝම්බර් 09 දිනැති කොන්ත්‍රාත්කරුගේ ඉල්ලීම අනුව මුල් කොන්ත්‍රාත් කාලයටත් වඩා වැඩි කාලයක් එනම් මාස හතරක කාලයක් වැඩ අධිකාරිගේ නිර්දේශ මත ලේකම් විසින් අනුමත කර දීර්ඝකර තිබුණි. ඒ අනුව 2018 පෙබරවාරි 15 දිනට වැඩ නිමකල යුතු වුවද 2018 මාර්තු 15 දින කරන ලද ස්ථානීය පරික්ෂණය අනුව ගිවිසුමේ සඳහන් වැඩ විෂයයන් 72 න් 53 ක් නිමකර නොතිබුණි.

## 4. පද්ධති හා පාලන

--------------------

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමුකර ඇති අතර, පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| | පද්ධතිය | අඩුපාඩුව |
|---|---|---|
| (අ) | ආදායම් පාලනය | හිඟ වරිපනම් ආදායම් අය කර ගැනීමට පියවර නොගැනීම. |
| (ආ) | ගිණුම්කරණය | ගිණුම් ශේෂ හා උපලේඛන ශේෂ අතර වෙනස්කම් පැවතීම. |
| (ඇ) | ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ක්‍රියාත්මක නොකිරීම හා ප්‍රමාද ගාස්තු අය නොකිරීම. |
| (ඇ) | වත්කම් පාලනය | සභාවේ වත්කම්වල අයිතිය තහවුරු කර නොගැනිම හා වත්කම් ලේඛන යාවත්කාලීන නොකිරීම. |